PAFFREL

# 2024 ජනාධිපතිවරණය

## පළමු අන්තර්කාලීන වාර්තාව (පූර්ව-මැතිවරණ සමය)

2024 සැප්තැම්බර් 12


නිදහස් සහ සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වය

නො. 16, බයර්ඩ් පෙදෙස, පාමංකඩ හරස් පාර, කොළඹ 06

+94 11 255 8570/71

paffrel@sltnet.lk

## අන්තර්ගතය

1. පසුබිම .......... 2
1.1. නාමයෝජනා .......... 2
1.2. අධික අපේක්ෂකයින් සංඛ්‍යාවක් .......... 3
2. ජනාධිපතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් උද්දේශන සහ නඩු පැවරීමේ උත්සාහයන් .......... 4
3. මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය .......... 5
3.1. පූර්ව-මැතිවරණ නිරීක්ෂණය .......... 5
3.1.1. තැපැල් ඡන්ද නිරීක්ෂණය .......... 5
3.1.2. දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් විසඳීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීම .......... 6
3.2. ඡන්ද විමසීමේ දින නිරීක්ෂණය .......... 6
3.3. පශ්චාත්-මැතිවරණ නිරීක්ෂණය .......... 6
3.4. සමාජ මාධ්‍ය නිරීක්ෂණය .......... 6
3.5. මැතිවරණ ප්‍රචාරණ වියදම් නිරීක්ෂණය .......... 7
4. පැමිණිලි වාර්තා කිරීමේ සහ අවම කිරීමේ ඒකකය .......... 8
4.1. මැතිවරණ පැමිණිලි .......... 8
4.2. මැතිවරණ නීති උල්ලංඝනය කිරීම .......... 8
4.3. රාජ්‍ය බලය, සම්පත් සහ සේවකයන් අයුතු ලෙස භාවිත කිරීම .......... 8
4.4. ප්‍රචණ්ඩ ක්‍රියා .......... 9
4.5. සාධනීය වර්ධනයන් .......... 10
5. මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන සඳහා රාමුවක් සකස් කිරීමේ මුලපිරීම් .......... 11
6. සියලු දෙනා ඇතුළත් කරගන්නා මැතිවරණයක් තහවුරු කිරීම .......... 11
7. 2024 ජනාධිපතිවරණ විවාදය .......... 12
8. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතාවගේ වගකීම .......... 12
9. ඇමුණුම් .......... 14

## 1. පසුබිම

ශ්‍රී ලංකාවේ නවවැනි විධායක ජනාධිපතිවරයා තෝරා ගන්නා ජනාධිපතිවරණය 2024 සැප්තැම්බර් මස 21 වැනි දින පැවැත්වීමට නියමිතය. 1982 සිට 2019 වසර දක්වා ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපතිවරුන් තෝරා ගැනීම සඳහා ජනාධිපතිවරණ අටක් පවත්වා ඇත. වසර පහක කාලයක් සඳහා ශ්‍රී ලංකාවේ ජනතාව ඍජුවම විධායක ජනාධිපතිවරයා තෝරා පත් කර ගනී. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් 1978 දී විධායක ජනාධිපති ක්‍රමය ස්ථාපිත කරන ලද අතර, 2015 වසර දක්වා ජනාධිපතිවරයා/වරිය වසර හයක (06) කාලයක් සිය ධූරය දැරීය. 1982 සිට 2019 දක්වා වූ ජනාධිපතිවරණ ප්‍රතිඵලවලින් පෙනී යන්නේ ප්‍රචාරණ කටයුතු සඳහා සාමාන්‍යයෙන් සති පහක (05) කාලයක් වෙන් කර ඇති බවයි. මෙවර එය සති 04 සිට 06 දක්වා කාලයකට නියම වේ. ජනාධිපතිවරණය පැවැත්වීමට නියමිත දිනයට දින දෙකක සිට "නිහඬ කාල සීමාව" බල පැවැත්වෙන හෙයින් ජනාධිපතිවරණයට අදාළ සියලුම ප්‍රචාරණ කටයුතු සැප්තැම්බර් 18 වැනිදා මධ්‍යම රාත්‍රිය 12වන විට නතර කළ යුතුය.

මීට අමතරව, වර්ෂ 1994, 2005 සහ 2015 ජනාධිපතිවරණවලදී නියමිත නිල ජනාධිපති කාල සීමාව ඉක්මවීමට ප්‍රථමව පිළිවෙලින් දින 54ක්, දින 25ක් සහ දින 54කට පෙර මැතිවරණ කැඳවූ බව එකී මැතිවරණ කාලසීමාව පරීක්ෂා කිරීමේදී පෙනී යයි. ඒ අනුව වත්මන් ජනාධිපතිවරයාගේ ධූර කාලය අවසන් වීමෙන් පසුව සිදුවන මීළඟ ජනාධිපතිවරයාගේ පත්වීම 2024 ඔක්තෝබර් 17 වැනිදාට පෙර සිදු විය යුතුය.

2024 ජනාධිපතිවරණය පැවැත්වෙන දිනය කල් දැමීම පිළිබඳව මහජනතාව සාධාරණ කනස්සල්ලකින් පසු විය. මේ සඳහා රටේ මැතිවරණ කල් දැමීමේ පූර්ව අත්දැකීම්ද හේතු විය. මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභාවල නිල කාලය 2023 මාර්තු 19 දක්වා දීර්ඝ කර නාමයෝජනා කැඳවූ නමුත්, මැතිවරණ දින නියමයක් නොමැතිව කල් දමා ඇත. එසේම, මෙම කාල සීමාව තුළම වත්මන් ජනාධිපතිවරයාගේ යෝජනාවකට අනුව සම්මත වූ පළාත් සභා මැතිවරණ ක්‍රමයේ සංශෝධනයක් හරහා අද දක්වා වසර 05කට වැඩි කාලයක් පළාත් සභා මැතිවරණ කල් දැමිණි.

විවිධ හේතූන් මත එළඹෙන ජනාධිපතිවරණය ශ්‍රී ලාංකිකයන්ට වැදගත්වනු ඇත. මේ දක්වාම පවතින ආර්ථික අර්බුදයෙන් පසු හිටපු ජනාධිපතිවරයාට එරෙහිව ඇති වූ ජනතා අරගලයකින් (අරගලය) පසු පැවැත්වෙන පළමු මැතිවරණය මෙයයි. හිටපු ජනාධිපතිවරයාට සහ රජයේ ප්‍රතිපත්තිවලට එරෙහිව දහස් සංඛ්‍යාත ජනතාවක් වීදි බැස විරෝධතාවයේ නිරත විය. දිගුකාලීන විදුලි කප්පාදුවක් ක්‍රියාත්මක කිරීමට රජය ගත් තීරණය, දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා දිගු පෝලිම්වල රැඳී සිටීමට ජනතාවට සිදු වීම වැනි හේතූන් මෙම විරෝධතාවලට හේතු වූ අතර, මෙකී තත්ත්වයන් අරගලය පෝෂණය කිරීමට දායක විය. කෙසේ වෙතත් වත්මන් ජනාධිපතිවරයා පත් කෙරුණේ හිටපු ජනාධිපතිවරයා ඉල්ලා අස්වීමත් සමගය. වත්මන් ජනාධිපතිවරයා ද අපේක්ෂකයකු ලෙස මෙවර ඉදිරිපත් වෙයි. විනිවිදභාවයෙන් හා වගවීමෙන් සමස්ත පාලන ක්‍රමයේම වෙනසක් අවශ්‍ය බවටවන පණිවිඩය ජනතාව විසින් අරගලය හරහා ගෙන ඒමට උත්සාහ කළහ. එහිදී ජනතා අභිලාෂයන් ප්‍රකාශ කිරීමේ අයිතිය ප්‍රබල ලෙස පිළිබිඹු වූ අතර, ඉදිරි මැතිවරණය තම මතය ප්‍රකාශ කිරීමට ජනතාවට උදාවන පළමු අවස්ථාවයි.

### 1.1. නාමයෝජනා

2024 ජූලි 26 වැනි දින මැතිවරණ කොමිෂන් සභාව විසින් නාමයෝජනා භාර ගැනීම, ඇප මුදල් තැන්පත් කිරීම සහ ඡන්ද විමසීම නිවේදනය කරන ලදී. මැතිවරණ කොමිසමේ මෙම ප්‍රකාශයට පත් කිරීම අනුව ජනාධිපතිවරණය සඳහා නාමයෝජනා භාර ගැනීම අගෝස්තු 15 වැනි දින පෙරවරු 09 සිට දහවල් 12 දක්වා මැතිවරණ කොමිෂන් සභාවේදී සිදු කිරීමට නියමිතව තිබුණි. නාමයෝජනා සම්බන්ධයෙන් විරෝධතා එදිනම එනම් අගෝස්තු 15 වැනි දින පෙරවරු 09 සිට දහවල් 12.00 දක්වා ඉදිරිපත් කළ හැකිව තිබුණි. නාමයෝජනා ඉදිරිපත් කිරීමට පෙර අපේක්ෂකයින් ඇපයක් ලෙස නියමිත මුදලක් තැන්පත් කළ යුතු වූ අතර, එය පිළිගත් දේශපාලන පක්ෂවල අපේක්ෂකයින් සඳහා රුපියල් 50,000.00 ක් සහ ස්වාධීන අපේක්ෂකයින් සඳහා රුපියල් 75,000.00 කි. තැන්පතු භාරගනු ලැබුවේ ජූලි 26 වැනි දින සිට වැඩ කරන දිනවල නාමයෝජනා දිනට පෙර දින එනම් අගෝස්තු 14 වැනි දින මධ්‍යහන 12 දක්වාය.

2024 අගෝස්තු 14 වන දින වනවිට අපේක්ෂකයින් 40 දෙනෙකු ඇප මුදල් තැන්පත් කර තිබිණි. ඡන්ද හිමියෙකු විසින් නාමයෝජනා කළ අපේක්ෂකයින් 17 දෙනෙකු, ලියාපදිංචි දේශපාලන පක්ෂවලින් 22 දෙනෙකු, සහ වෙනත් දේශපාලන පක්ෂවලින් 01 අයෙකු ලෙස, අපේක්ෂකයින් 39 දෙනෙකු සිය ඇප මුදල් භාර දුන් අතර, එක් අපේක්ෂකයෙකුට නාමයෝජනා භාරදීමට නොහැකි වූ අතර තවත් අපේක්ෂකයෙකු ජනාධිපතිවරණයට පෙර මිය ගියේය. වාර්තාගත අපේක්ෂකයන් සංඛ්‍යාවක් මෙවර ඉදිරිපත්වන නමුත් මෙම ලැයිස්තුවේ එකදු කාන්තා අපේක්ෂිකාවක් හෝ නොමැත.

2024 ජනාධිපතිවරණය සඳහා ඡන්ද දායකයින් 17,140,354ක් සුදුසුකම් ලබා ඇත. මෙම ඡන්දදායකයින්ට ඡන්ද කොට්ඨාශ 13,421ක් හරහා තම ඡන්ද අයිතිය භාවිත කරනු ඇත. එසේම, මෙවර ජනාධිපතිවරණය මැතිවරණය දේශපාලන ක්‍රමයේ සහ දේශපාලන සංස්කෘතියේ පුළුල් වෙනස්කම් අපේක්ෂා කරන මහජනතාවට විශාල වශයෙන් වැදගත් වේ.

## 1.2. අධික අපේක්ෂකයින් සංඛ්‍යාවක්

ශ්‍රී ලංකාවේ වත්මන් තත්ත්වය අනුව විශේෂයෙන්ම අපේක්ෂකයින් විශාල සංඛ්‍යාවක් සිටීම රටට අභියෝගයක් වේ. අපේක්ෂකයින් සංඛ්‍යාව වැඩි වීම සහ ඒ ඔස්සේ මැතිවරණ ප්‍රචාරක වියදම් ඉහළ යාම රටේ මූල්‍ය සම්පත් පීඩාවට පත් කිරීමට හේතු වී ඇත. තවද, මැතිවරණ ක්‍රියාවලිය පුරාවට මෙතරම් විශාල අපේක්ෂකයන් සංඛ්‍යාවක් කළමනාකරණය කිරීම නිසා වියදම් වැඩි වී ප්‍රවර්ථන දුෂ්කරතා ඇති වී තිබේ.

පැෆ්රල් සංවිධානය විසින් රටේ උසස් රාජ්‍ය තනතුරු සඳහා ඉදිරිපත් වීමට පුද්ගලයෙකුට ඇති මූලික අයිතිවාසිකම  පිළිගෙන එය තහවුරු කරන අතරම, අපේක්ෂකයින් කී දෙනෙකු තම දේශපාලන විශ්වාසයන් ප්‍රකාශ කිරීමෙන් ජයග්‍රහණය කිරීමට අවංකව උත්සාහ කරන්නේද යන්න මෙන්ම ඔවුන් අතරින් තමන්ගේ පෞද්ගලික සහ දේශපාලන අරමුණු ඉටුකර ගැනීම සඳහා මහජනතාව රැවටීමට උත්සාහ කරන්නේද යන්න පිළිබඳව සියුම් විශ්ලේෂණයක් කිරීම වැදගත් වේ.

| වර්ෂය | මැතිවරණයට තරග කළ දේශපාලන පක්ෂ සහ ස්වාධීන අපේක්ෂකයින් සංඛ්‍යාව | ඉහළම ඡන්ද ලබාගත අපේක්ෂකයන් දෙදෙනා හැර අන් අය ලබාගත් ඡන්ද සංඛ්‍යාව | ඉහලම ඡන්ද ලබාගත් අපේක්ෂයින් හැර අනෙක් ඇය ලබාගත් ඡන්ද සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| 1982 | 06 | 522,898 | 8.02% |
| 1988 | 03 | 235,719 | 4.62% |
| 1994 | 06 | 137,038 | 1.81% |
| 1999 | 13 | 520,849 | 6.17% |
| 2005 | 12 | 117,167 | 1.28% |
| 2010 | 22 | 208,689 | 1.97% |
| 2015 | 19 | 138,200 | 1.14% |
| 2019 | 35 | 764,005 | 5.77% |
| 2024 | 39 | | |

ඒ අනුව ඉදිරි ජනාධිපතිවරණයේදී පුද්ගලික හෝ දේශපාලන වාසි මත තරග කරන අපේක්ෂකයන් අධෛර්යමත් කළ යුතු අතර, ඒ සඳහා සුදුසු ව්‍යවස්ථාමය රාමුවක් සකස් කළ යුතුව ඇත. එසේ නොවුණහොත් ඉදිරි මැතිවරණවලදීත් අපේක්ෂක ලැයිස්තුව වැඩි වීමට ඉඩ ඇත. අපේක්ෂකයින් සංඛ්‍යාව වැඩිවීම නිසා මැතිවරණ කොමිෂන් සභාවට විශාල සම්පත් ප්‍රමාණයක් වැය කිරීමට සිදු වේ. ඒ හා සමපාතවන ප්‍රායෝගික ගැටලු රාශියක් උද්ගත වේ. උදාහරණයක් ලෙස, ඡන්ද මධ්‍යස්ථානයක අපේක්ෂකයින් සංඛ්‍යාව වැඩිවන විට, දිගු ඡන්ද පත්‍රිකා, ගණන් කිරීමට අමතර කාලයක් ගත වන වීම, අපේක්ෂකයින්ගේ ඡන්ද නියෝජිතයින් වැඩි පිරිසක් ඡන්ද මධ්‍යස්ථානයට රැස් විය හැකි වීම, දිගු ලැයිස්තුව අතුරින් ඡන්දදායකයින්ට නියමිත අපේක්ෂකයා තෝරා ගැනීමට අපහසු වීම ආදිය පෙන්වා දිය හැක.

## 2. ජනාධිපතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් උද්දේශන සහ නඩු පැවරීමේ උත්සාහයන්

මැතිවරණවලට අදාළ පවත්නා නීති, රෙගුලාසි, ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලීන් සමාලෝචනය කිරීම සහ නීතියේ සහ භාවිතයේ වෙනස්කම් ඇති කිරීමට යෝජනා ඉදිරිපත් කිරීමේ අරමුණ පැෆ්රල් සංවිධානය තුළ නිරන්තරයෙන්ම පවතී. ඒ අනුව, 2024 ජනාධිපතිවරණය ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් පැෆ්රල් සංවිධානය යම් යම් උද්දේශන කටයුතුවල නිරත විය.

2024 ජූලි මාසයේදී, SCFR177/2024 යටතේ, චමින්ද දයාන් ලෙනව යන අය විසින් මැතිවරණ කොමිෂන් සභාවේ කොමිෂන් ජනරාල් සමන් ශ්‍රී රත්නායක, සහ වෙනත් අයට එරෙහිව පෙත්සමක් ගොනු කළේය. මෙය ගොනු කරන ලද්දේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවැනි සංශෝධනය අභියෝගයට ලක් කරමින් ඉදිරිපත් කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සමකට අදාළවයි. පෙත්සම්කරු-වගඋත්තරකරු විසින් ජනාධිපති ධූර කාලය වසර හයේ සිට පහ දක්වා අඩු කරන ලද සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කර ඇති පරිදි, දහනවවැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ජනමත විචාරණයකින් අනුමත නොකළ නිසා එය වලංගු නොවන බවට අභියෝග කරන ලදී. මෙම ගැටලුව විසඳන තෙක් 2024 ජනාධිපතිවරණය කල් දැමීමට එමගින් පෙත්සම්කරු ඉල්ලා සිටියේය. පැෆ්රල් සංවිධානය සහ එහි විධායක අධ්‍යක්ෂවරයා මෙම නඩුවට මැදිහත් වූ අතර, මැතිවරණය ප්‍රමාද කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට සහ පුරවැසියන්ගේ ඡන්ද අයිතියට හානියක් බවට තර්ක කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාපිත අයිතිවාසිකම් තහවුරු කිරීමට සහ මැතිවරණ ක්‍රියාවලියේ අඛණ්ඩතාව තහවුරු කිරීමට මැතිවරණය නියමිත වේලාවට පැවැත්වීමේ අවශ්‍යතාව එහිදී අවධාරණය කරන ලදී. මෙම ක්‍රියාවලිය අවසානයේදී පෙත්සම විභාගයට නොගෙන නිෂ්ප්‍රභ කළ අතර, අධිකරණ ගාස්තු ලෙස රුපියල් ලක්ෂයක් ගෙවන ලෙසද නියෝග කළේය.

නැවතත් 2024 ජූලි මාසයේදී, SCFR191/2024 යටතේ, අරුණ ලක්සිරි උණවටුන යන අය විසින් මැතිවරණ කොමිෂන් සභාවේ කොමිෂන් ජනරාල් සමන් ශ්‍රී රත්නායක, සහ වෙනත් අයට එරෙහිව පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කළේය. මෙම නඩුවට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවැනි සංශෝධනයේ නීත්‍යානුකූලභාවය අභියෝගයට ලක් කරන මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඇතුළත් විය. පෙත්සම්කාර වගඋත්තරකරු තර්ක කළේ ජනාධිපති ධූර කාලය සහ විසුරුවා හැරීමේ බලතල වෙනස් කිරීම සම්බන්ධයෙන්වන සංශෝධනය නිසි ලෙස බලාත්මක කළ නොහැකි වන්නේ එයට අවශ්‍ය ජනමත විචාරණයක් පවත්වා නොමැති බව දක්වමිනි. ඔවුන් උත්සාහ කළේ 2024 ජනාධිපතිවරණය මේ ප්‍රශ්නය විසඳන තුරු කල් දැමීමටයි. පැෆ්රල් සංවිධානය මෙහිදී මැදිහත්කාර පාර්ශ්වයක් ලෙස තර්ක කළේ සංශෝධනය නිසියාකාරව ක්‍රියාත්මක කර ඇති බවත් මැතිවරණය ප්‍රමාද කිරීමෙන් පුරවැසියන්ගේ මූලික ඡන්ද අයිතිය උල්ලංඝනය වන බවත්ය. විසිවැනි සංශෝධනය මගින් ප්‍රශ්නගත විධිවිධාන වෙනුවට ආදේශ කර ඇති බව ද මෙහිදී පෙන්වා දුණි. මෙම ක්‍රියාවලිය අවසානයේදී පෙත්සම විභාගයට නොගෙන නිෂ්ප්‍රභ කළ අතර, අධිකරණ ගාස්තු වශයෙන් රුපියල් ලක්ෂ පහක් ගෙවන ලෙසද පෙත්සම්කාර වග උත්තරකරුට නියෝග කළේය.

ජනාධිපතිවරණය සුමට අන්දමින් පැවැත්වීම සඳහා හිටපු පොලිස්පතිවරයාගේ ප්‍රශ්නය විසඳන ලෙෂ ඉල්ලා සිටීමටද පැෆ්රල් සංවිධානය මැදිහත් විය. මෙයට අදාළ නඩු කටයුත්තේදී ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළේ පොලිස්පතිවරයාට එරෙහිව පවරා ඇති නඩුව විභාගවන තෙක් ඔහුගේ වැඩ තහනම් කළ යුතු බවයි. මෙය නව ජනාධිපතිවරයෙකු තෝරා පත් කර ගැනීමට ජනතාවට ඇති හැකියාවට බාධාවක් විය හැකි බවට පැෆ්රල් සංවිධානය විසින් සිය කණගාටුව ප්‍රකාශ කරන ලදී. කෙසේ වෙතත්, මෙම අවිනිශ්චිතභාවය රාජ්‍යයට, ජනතාවට සහ රාජ්‍ය නායකයාට අහිතකර ලෙස බලපාන බවත්, ප්‍රජාතන්ත්‍රවාදයේ සහ මැතිවරණ ක්‍රියාවලියේ අඛණ්ඩතාවට අගතිගාමීවන බවත්, මැතිවරණ සඳහා සුදුසු පොලිස් සහභාගීත්වය සහතික කිරීම සඳහා විකල්ප විධිවිධාන සම්පාදනය කළ යුතු බවත්, පැෆ්රල් සංවිධානය අවධාරණය කර ඇත.

## 3. මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය

2024 ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, පැෆ්රල් සංවිධානය විසින් පුළුල් මැතිවරණ නිරීක්ෂණ ව්‍යාපාරයක් ආරම්භකළ අතර, එය පහත ආකාරයට අදියර තුනකින් ක්‍රියාත්මක කෙරේ :

1) පූර්ව-මැතිවරණ නිරීක්ෂණය,
2) මැතිවරණ දින නිරීක්ෂණය සහ
3) පශ්චාත්-මැතිවරණ නිරීක්ෂණය

මෙම මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලියේ අරමුණු පහත පරිදි වේ.

- මැතිවරණ නීති උල්ලංඝනය කිරීම, ප්‍රචණ්ඩත්වය නිරීක්ෂණය කිරීම, වාර්තා කිරීම, වැළැක්වීමේ සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට සහාය වීම.
- මැතිවරණ නීත්‍යානුකූල බව සහ ඡන්දදායකයින් විසින් පිළිගන්නා බව සහතික කිරීම සඳහා මැතිවරණ පාර්ශ්වකරුවන්ගේ හැසිරීම නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම.
- මැතිවරණයෙන් ඔබ්බට ක්‍රියාශීලී වීමට සහ ප්‍රජාතන්ත්‍රවාදී සහ පාලන ක්‍රියාවලීන්ට සම්බන්ධ වීමට මහජනතාවගේ ඉහළ මැදිහත්වීම ප්‍රවර්ධනය කිරීම.

### 3.1. පූර්ව-මැතිවරණ නිරීක්ෂණය

පැෆ්රල් සංවිධානය විසින් බොහෝ දිස්ත්‍රික් මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රජා මූල සංවිධාන සමග සම්බන්ධ වී පූර්ව-මැතිවරණ නිරීක්ෂණ කටයුතු සිදු කරයි. දිවයිනේ සෑම ඡන්ද කොට්ඨාසයක්ම ආවරණය කිරීම සඳහා පැෆ්රල් සංවිධානය දිගුකාලීන නිරීක්ෂකයින් 160 ක් යොදවා ඇත. සම්පත් අවභාවිතය, මැතිවරණ නීති සහ රෙගුලාසි උල්ලංඝණය කිරීම, මැතිවරණ කොමිසමේ මැතිවරණ සූදානම, අපේක්ෂකයින්ගේ ප්‍රචාරක රැළිවල ක්‍රියාකාරීත්වය, සුළුතර/ආන්තික ප්‍රජාවන්ට එරෙහිව සිදු කරන අපහාසාත්මක ක්‍රියා හෝ කතා හෝ ප්‍රචාර පිළිබඳ ඇතුළුව ඕනෑම අක්‍රමිකතාවක් නිරීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට මෙම දිගුකාලීන නිරීක්ෂකයින් පුහුණුව ලබා ඇත.

#### 3.1.1. තැපැල් ඡන්ද නිරීක්ෂණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ කාර්යාල සහ පොලිසිය යන ආයතනවල සුදුසුකම් ලත් ඡන්දදායකයින් සඳහා තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම 2024 සැප්තැම්බර් 04 වැනි දින පැවැත් වූ අතර, ත්‍රිවිධ හමුදාවේ ඡන්ද දායකයින් සඳහා 2024 සැප්තැම්බර් 05 සහ 06 යන දෙදින තැපැල් ඡන්දය සඳහා වෙන් විය. ඉහත සඳහන් කළ කිසිදු දිනක තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ අය සඳහා 2024 සැප්තැම්බර් 11 සහ 12 යන දිනවල තම සේවා ස්ථාන පිහිටි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලදී ඡන්දය භාවිතා කිරීමට අවස්ථාව ලැබිණි. මෙවර ජනාධිපතිවරණයේ තැපැල් ඡන්දය සඳහා ලැබුණු මුළු තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාව 736,589 ක් වන අතර, ඉන් 712,318 ක් පිළිගෙන ඇති අතර, එබැවින් ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සංඛ්‍යාව 24,268 කි.

තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමේ දිනවලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල, බස් ඩිපෝ, අධ්‍යාපන කාර්යාල, හමුදා කඳවුරු, මැතිවරණ දිනයට යෙදවීමට නියමිත රාජ්‍ය නිලධාරීන් විශාල සංඛ්‍යාවක් සිටින පොලිස් ස්ථාන වැනි දේශපාලනික වශයෙන් සංවේදී මධ්‍යස්ථානවල පැෆ්රල් සංවිධානය මගින් නිරීක්ෂකයන් 900ක් යොදවා තිබුණි.

තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමේ පළමු දින තුන තුළ පැෆ්රල් සංවිධානයට පැමිණිලි රැසක් ලැබිණි. ලේඛනගත වූ සිද්ධීන් අතර සැළකිය යුතු අවස්ථා කිහිපයක් මේ අතර තිබේ. සැප්තැම්බර් 04 වෙනිදා උතුරු පළාතේ එක් දේශපාලනඥයෙකු තැපැල් ඡන්දයේදී ඡන්දය නොදෙන ලෙස බලකරමින් මැදිහත් වී ඇත. එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සේවයේ නියුතු තැපැල් ඡන්ද දායකයින් වෙත සැප්තැම්බර් 05 වැනිදා ඡන්ද පත්‍රිකා එවා නොමැති බවට වාර්තා වූ අතර, ඡන්ද පත්‍රිකා නිකුත් කළ බව මැතිවරණ කොමිෂන් සභාව පවසා ඇත. හැටන් අධ්‍යාපන කලාපයේ පාසැලක විදුහල්පතිවරයෙකු ගුරුවරුන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීම වැළැක්වීමට මැදිහත් වී ඇත. මෙම ප්‍රධාන සිද්ධීන්ට අමතරව මුතූර්, කුරුණෑගල, අවිස්සාවේල්ල, කළුතර, බත්තරමුල්ල, වාරියපොළ, සීතාවක, වලපනේ, වීරකැටිය, හෝමාගම, දෙහිවල-

ගල්කිස්ස වැනි විවිධ ප්‍රදේශවල සුළු මට්ටමේ සිද්ධීන් වාර්තා වී ඇත. එසේ වුවද, තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමේදී මැතිවරණයට විශාල බලපෑමක් ඇති කළ තත්ත්වයන් හෝ අවස්ථා වාර්තා වී නොමැත.

### 3.1.2. දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් විසඳීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීම

මැතිවරණ කොමිෂන් සභාව, දේශපාලන පක්ෂ සහ මැතිවරණ නිරීක්ෂණ ආයතන වැනි මැතිවරණයට සම්බන්ධ සියලු පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගනිමින් මැතිවරණ ආරවුල් විසඳීම සහ අවම කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව විසින් වර්ෂ 2001 දී පැෆ්රල් සංවිධානයේ මූලිකත්වයෙන් සර්ව පාක්ෂික මෙහෙයුම් ඒකක පිහිටුවන ලදී. පසුව මෙය දිස්ත්‍රික් මට්ටම දක්වා ව්‍යාප්ත කර මැතිවරණ ආරවුල් විසඳීමේ මධ්‍යස්ථාන බවට පත් කරන ලදී.

මැතිවරණ ආරවුල් විසඳීමේ මධ්‍යස්ථාන 2024 ජූලි 26 වැනි දින සිට මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කර සතියක් ගත වන තෙක් ක්‍රියාත්මක කිරීමට ස්ථාපිත කරන ලදී. මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් සහ ඡන්ද විමසීමට බාධා කිරීම් සම්බන්ධ පැමිණිලි සම්බන්ධයෙන් මෙම මධ්‍යස්ථාන වහා මැදිහත් වේ. පැෆ්රල් විසින් මැතිවරණ ආරවුල් විසඳීමේ මධ්‍යස්ථාන ක්‍රියාවලීන් ආවරණය කිරීම සඳහා මැතිවරණ ආරවුල් විසඳීමේ මධ්‍යස්ථාන නිරීක්ෂකයින් 25 දෙනෙකු දිස්ත්‍රික්ක 25 තුළම යොදවා ඇති අතර, මෙම නිරීක්ෂකයින් දිනපතා කොළඹ පිහිටි පැෆ්රල් සංවිධානයේ ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා කරයි.

## 3.2. ඡන්ද විමසීමේ දින නිරීක්ෂණය

ඡන්ද විමසීමේ දිනයේ නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා අවශ්‍ය තත්ත්වයක් ස්ථාපනය කිරීම සඳහා, ස්ථානගත නිරීක්ෂකයින් 3000 ක්, ජංගම නිරීක්ෂක ඒකක 164 ක් සහ දිගුකාලීන නිරීක්ෂකයින් 160 ක් ඇතුළුව නිරීක්ෂකයින් 5000 කට ආසන්න සංඛ්‍යාවක් යෙදවීමට පැෆ්රල් සංවිධානය සැලසුම් කර ඇත. තවද, කලින් තීරණය කළ අවදානම් ප්‍රදේශ වෙත විශේෂ ජංගම ඒකක 10 ක් යැවීමට පැෆ්රල් සංවිධානය අදහස් කර ඇත. එමෙන්ම, ඡන්ද ගණන් කිරීමේ නිරීක්ෂකයින් 200 ක්, දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් 37 ක් සහ ක්ෂේත්‍ර සම්බන්ධීකාරකවරුන් 27 ක් ඡන්ද විමසීම පැවැත්වෙන දිනයේදී ක්ෂේත්‍රයේ රැඳී සිටිති.

## 3.3. පශ්චාත්-මැතිවරණ නිරීක්ෂණය

මැතිවරණයේ නිල ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව පශ්චාත් මැතිවරණ නිරීක්ෂණ කටයුතු සිදු කෙරෙන අතර, එහි අරමුණ වන්නේ යහපත් ප්‍රජාතන්ත්‍රවාදයේ තවත් කැපී පෙනෙන සලකුණක්වන සාමකාමී සහ සුමට බල සංක්‍රමණයක් දක්වා එය අඛණ්ඩව සිදු කිරීමයි. මෙම කාල පරිච්ඡේදය තුළ ප්‍රධාන වශයෙන් නිරීක්ෂණ කටයුතු සිදු කරන්නේ දිගුකාලීන නිරීක්ෂකයින් විසිනි.

## 3.4. සමාජ මාධ්‍ය නිරීක්ෂණය

2015 වසරේ සිට ආරම්භ වූ Hashtag Generation සහ මැතිවරණ කොමිෂන් සභාව සමග ඇති කරගත් දීර්ඝ කාලීන විශ්වාසනීය සමාජ මාධ්‍ය නිරීක්ෂණ යාන්ත්‍රණ හවුල්කාරිත්වය ඔස්සේ පැෆ්රල් සංවිධානය විසින් අඛණ්ඩව සමාජ මාධ්‍ය නිරීක්ෂණය සිදු කරන ලදී. 2019 ජනාධිපතිවරණයට පෙරාතුව ශ්‍රී ලංකාවේ මෑත වසරවලදී සමාජ මාධ්‍ය වේදිකාවල සමාජ-දේශපාලන කතිකාවන් ශීඝ්‍රයෙන් වර්ධනය වුවද, ජාතික මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් මෙම වේදිකා බොහෝ දුරට අධීක්ෂණයට ලක් නොවූ බව පැෆ්රල් සංවිධානයේ නිරීක්ෂණයට හසුව ඇත. මෙම සන්දර්භය තුළ, පැෆ්රල් සංවිධානය Hashtag Generation සමග හවුල්ව, ජනාධිපතිවරණයට පෙර, පැවැත්වෙන අතරතුර සහ ඉක්බිතිව, ඉලක්කගත ලෙස ෆේස්බුක් සමාජ ජාලයෙහි මැතිවරණ නීති උල්ලංඝනය කිරීම්, වැරදි තොරතුරු සහ වෛරී ප්‍රකාශ හඳුනාගැනීම අරමුණු කරගත් බහුවිධ උපාය මාර්ගයක් ක්‍රියාවට නැංවීමට ඉලක්කගත මැදිහත්වීමක් කර ඇත.

වෛරී ප්‍රකාශ, වැරදි තොරතුරු, මහජනතාව නොමග යවන සහ අවුල් වියවුල් ඇති කළ හැකි නුසුදුසු පැහැදිලි කිරීම් නිරීක්ෂණය කිරීම සඳහා කණ්ඩායමක් යොදවා ඇති අතර, ඒවා අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා මැතිවරණ කොමිසමේ අවධානයට යොමු කරනු ඇත. මැතිවරණ කොමිසමේ අවධානයෙන් පසුව අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා මෙම සිදුවීම් ශ්‍රී ලංකාවේ ෆේස්බුක් සමාජ ජාලයේ නියෝජිතයන් වෙත යොමු කිරීමට නියමිතය.

පැෆ්රල් සංවිධානය 2024 ජනාධිපතිවරණය සඳහා සමාජ මාධ්‍ය හරහා පූර්ව මැතිවරණ නිරීක්ෂණ ආරම්භ කර ඇති අතර, සමාජ මාධ්‍ය ක්‍රියාකාරකම් පිළිබඳව දිනපතා මැතිවරණ කොමිෂන් සභාවට වාර්තා කරයි. 2024 අගෝස්තු 17 සිට සැප්තැම්බර් 11 දක්වා, මෙම කණ්ඩායම විසින් සමාජ මාධ්‍ය නිරීක්ෂණය කළ අතර ෆේස්බුක් සමාජ ජාලයෙහි නිරීක්ෂණය කිරීම් 300 ක්, TikTok හි 83 ක්, YouTube හි 19 ක් සහ Twitter හි 07 ක් හඳුනාගෙන් ඇත. ඒ අතරින් 195 ක් මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් සහ 186 ක් ප්‍රජා ප්‍රමිතීන් උල්ලංඝනය කිරීම් වේ (වැරදි තොරතුරු 90 ක්, වෛරී ප්‍රකාශ 35 ක්, හිරිහැර කිරීම් සහ හිරිහැර කිරීම්, දේශපාලන දැන්වීම් විනිවිදභාවය සම්බන්ධව 22 ක්, ප්‍රචණ්ඩත්වය දිරිගැන්වීම් 14 ක්, බාලවයස්කරුවන් භාවිතා කිරීම් 09 ක්, බිම් මට්ටමේ ප්‍රචණ්ඩත්වය 02 ක්, ප්‍රචණ්ඩකාරී සහ අපරාධ හැසිරීම් 06 ක්, සහ මැතිවරණයේ සුපිලිපන්නභාවයට බාධා කිරීම් 08 ක් මෙයට ඇතුළත්ය). පැෆ්රල් සංවිධානය මැතිවරණ කාලය පුරාවටම සමාජ මාධ්‍ය නිරීක්ෂණ කටයුතු කරගෙන යයි.

### 3.5. මැතිවරණ ප්‍රචාරණ වියදම් නිරීක්ෂණය

ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට, 2023 අංක 3 දරණ මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත මැතිවරණවලදී මෙවර ජනාධිපතිවරණයේදී ප්‍රචාරක මූල්‍ය නියාමනය කරයි. ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව ප්‍රකාශ කළ පරිදි, 2023 අංක 3 දරණ මැතිවරණ වියදම් නියාමන රෙගුලාසිය සියලු අපේක්ෂකයන්ට අදාළ වේ. අපේක්ෂකයින් සමග සාකච්ඡා කිරීමෙන් පසුව, ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා එක් ඡන්ද දායකයෙකුට රුපියල් 109.00 ක වියදම් සීමාවක් පනවා ඇත. එබැවින් 2024 ජනාධිපතිවරණයට ඉදිරිපත්වන අපේක්ෂකයෙකු සඳහා වියදම් කිරීමට වෙන් කර ඇති මුළු අයවැය රු.1,120,979,151.60 කි. එය මුළු අවසර ලත් වියදම් වලින් 60% ක් නියෝජනය කරයි. ඉතිරි 40% ක් වූ රු.747,319,434.40 පිළිගත් දේශපාලන පක්ෂයකට, වෙනත් දේශපාලන පක්ෂවලට හෝ අපේක්ෂකයෙකු නම් කළ ඡන්දදායකයින්ට වියදම් කළ හැකිය. මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කර දින විසි එකක් (21) ඇතුළත අපේක්ෂකයන් සියලු මැතිවරණ ප්‍රචාරක වියදම් ඇතුළුව වියදම් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. අතිරේක වශයෙන්, අපේක්ෂකයා වෙනුවෙන් ලැබෙන ඕනෑම පරිත්‍යාගයක් හෝ දායකත්වයක්, ඒවායේ ඇස්තමේන්තුගත වටිනාකමක් ලැබී ඇත්නම් වාර්තා කළ යුතුය. දායක මුදල් තෑගි, ණය, අත්තිකාරම් හෝ තැන්පතු ලෙස ලබා දුන්නේද යන්න සඳහන් කළ යුතුය. ජනාධිපතිවරණ අපේක්ෂකයින් තම ප්‍රචාරක අරමුදල් වෙන් කර ඇති සීමාවන් තුළ වියදම් කරන්නේද යන්න සොයා බැලීම සඳහා, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV), ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (TISL), Hashtag Generation, නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ව්‍යාපාරය (CaFFE), ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ (IRES) සහ පැෆ්රල් ඇතුළු විවිධ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් සහයෝගී ප්‍රයත්නයක් දරයි.

මේ අනුව, අපේක්ෂකයින් සහ දේශපාලන පක්ෂවල ප්‍රචාරක වියදම් අධීක්ෂණය, ඇස්තමේන්තු කිරීම සහ විශ්ලේෂණය කිරීමේ අරමුණින් "ඡන්ද සල්ලි මීටරේ" නම් වූ මෙවලමක් හඳුන්වා දී ඇත. මෙම විශේෂිත වෙබ් අඩවිය හරහා, මැතිවරණ නිරීක්ෂණ ආයතන ඒකාබද්ධව, මැතිවරණ ව්‍යාපාරවල මූල්‍ය භූමිකාව සහ ඡන්දදායකයින්ගේ තීරණ කෙරෙහි එහි බලපෑම පිළිබඳ මහජන දැනුම ඉහළ නැංවීමෙන් මැතිවරණ ප්‍රචාරක මූල්‍ය නිරීක්ෂණ කටයුතු සඳහා පුරවැසියන් සම්බන්ධ කර ගැනීමට සහාය වේ. ජනාධිපතිවරණ අපේක්ෂකයින්ගේ වියදම් නිරීක්ෂණය කිරීමට සහ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය, සමාජ මාධ්‍ය, පොදු ප්‍රචාරණ, පොදු සිදුවීම්, මාධ්‍ය සාකච්ඡා සහ සමාරම්භක උත්සව සහ ප්‍රචාරක කාර්යාල වැනි කාණ්ඩ කිහිපයක් පිළිබඳ සවිස්තරාත්මක දත්ත සැපයීමට පැෆ්රල් විසින් නිරීක්ෂකයින් 40 දෙනෙකු පුහුණු කර ඇත. පැෆ්රල් මැතිවරණ මූල්‍ය හා සම්බන්ධ දිගුකාලීන නිරීක්ෂකයින් විසින් මේ දක්වා අපේක්ෂකයින් 06 දෙනෙකුගෙන් ප්‍රචාරක නිලධාරීන් 409 ක්, ප්‍රචාරක සිදුවීම් 178 ක් සහ මාධ්‍ය සම්මන්ත්‍රණ සහ සමාරම්භක උත්සව 11 ක් වාර්තාකොට ඇත.

## 4. පැමිණිලි වාර්තා කිරීමේ සහ අවම කිරීමේ ඒකකය

ඕනෑම පැමිණිල්ලක් ඉතා කඩිනමින් අධීක්ෂණය කිරීමට, ලැබීමට සහ හැසිරවීමට කැපවූ මැතිවරණ පැමිණිලි ඒකකයක් පැෆ්රල් සංවිධානය මගින් පිහිටුවනු ලැබ ඇත. ජනාධිපතිවරණය සඳහා නාමයෝජනා කැඳවීමට පෙර මෙම ඒකකය ස්ථාපිත කිරීමට කටයුතු යෙදූ අතර, එම ඒකකය පශ්චාත්-මැතිවරණ කාලය අවසන් වනතුරු 16 දෙනෙකුගෙන් සමන්විතව කණ්ඩායමක් හරහා ක්‍රියාත්මක වේ.

මෙම ඒකකයට තනි පුද්ගලයින්, සේවයෙහි යොදවා ඇති ස්වාධීන නිරීක්ෂකයින් සහ දේශපාලන පක්ෂ, මාධ්‍ය නාලිකා (මහජන සහ සමාජ) වෙතින් ලැබෙන සියලුම පැමිණිලි සත්‍යාපනය කර, තහවුරු කර අවශ්‍ය පසු විපරම් සහ විසඳීම සඳහා සුදුසු බලධාරීන් සහ ආයතන වෙත යොමු කරනු ලැබේ. පැෆ්රල් සංවිධානය ඔවුන්ගේ පැමිණිලි, ඒවායේ අදාළත්වය අනුව, පොලිස් දෙපාර්තමේන්තුවට, මැතිවරණ කොමිසමට, අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට යොමු කරයි. පැෆ්රල් සංවිධානය විසින් මෙම ආයතනවලට ඔවුන්ගේ විමර්ශන සිදුකිරීමට සහාය වන අතර, පැමිණිලි සම්බන්ධයෙන් පසු විපරම් කිරීම සහ අවශ්‍ය නම් නීතිමය ක්‍රියාමාර්ග ඇතුළුව අවශ්‍ය අවම කිරීම් සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගනු ඇත.

### 4.1. මැතිවරණ පැමිණිලි

2024 ජූලි 27 සිට 2024 සැප්තැම්බර් 11 දක්වා පැෆ්රල් සංවිධානය වෙත පැමිණිලි 1153 ක් ලැබී ඇත (ඇමුණුම 01 සහ ඇමුණුම 02). මෙම පැමිණිලි, මැතිවරණ නීති උල්ලංඝණය කිරීම, රාජ්‍ය බලය, සම්පත් සහ සේවකයින් අයුතු ලෙස භාවිත කිරීම, සහ ප්‍රචණ්ඩ ක්‍රියා දක්වා විහිදේ.

### 4.2. මැතිවරණ නීති උල්ලංඝනය කිරීම

වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ මැතිවරණ නීති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන්වන අතර, එය පැමිණිලි 900 කි. නීතිවිරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් පැමිණිලි 617 ක් ලැබී ඇති අතර, දේශපාලන අරමුණු ඇතිව දිරිගැන්වීම් ලබාදීම සම්බන්ධයෙන් පැමිණිලි 94 ක් ලැබී ඇත. එමෙන්ම නීතිවිරෝධී පක්ෂ කාර්යාල පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පැෆ්රල් සංවිධානයට පැමිණිලි 45 ක් ලැබී ඇති අතර, අසත්‍ය ප්‍රචාර පැතිරවීම සම්බන්ධයෙන් පැමිණිලි 13 ක් ලැබී ඇත.

### 4.3. රාජ්‍ය බලය, සම්පත් සහ සේවකයන් අයුතු ලෙස භාවිත කිරීම

විධායකය විසින් භුක්ති විඳින ලද රාජ්‍ය බලය සහ සම්පත් අමු අමුවේ අවභාවිත කිරීමට ජනාධිපති කාර්යාලය විසින් සෘජුවම කටයුතු කර ඇති බව පැෆ්රල් සංවිධානය විසින් නිරීක්ෂණය කරනු ලැබ ඇති අතර, ඒවා අවම කිරීමේ අරමුණින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

පැෆ්රල් සංවිධානය සංවර්ධන සහ ආධාර ව්‍යාපෘතිවලට විරුද්ධ නොවන නමුත්, පක්ෂ සහ අපේක්ෂකයින් ප්‍රවර්ධනය කිරීම සඳහා ඒවා යොදා ගැනීමට විරුද්ධව ඒ සඳහා අවශ්‍ය පරිදි නීතිමය ක්‍රියාමාර්ග ලබාගෙන ඇත.

2024 අප්‍රේල් 29 දිනැති PS/SB/Circular/5/2024 චක්‍රලේඛය යටතේ, ග්‍රාමීය මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් අධීක්ෂණය කිරීම සඳහා ප්‍රජාවගේ ප්‍රශස්ත දායකත්වය ලබා ගැනීමේ අරමුණින් 2024 අප්‍රේල් 25 දින සිට පළාත් පාලන බල ප්‍රදේශ සඳහා ප්‍රජා උපදේශක කමිටු පිහිටුවීම පිළිබඳව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් දැනුම් දෙන ලදී. මෙම ක්‍රියාවලියට මතු වූ විරෝධතාවයේ වැදගත් සංධිස්ථානයක් ලෙස, ග්‍රාමීය ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් රජයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පත් කරන ලද ප්‍රජා උපදේශක කමිටු ක්‍රියාත්මක කිරීම වළක්වාලමින් ශ්‍රී ලංකාවේ ශේෂ්ඨාධිකරණය අතුරු තහනම් නියෝගයක් නිකුත් කළේය. 2023 දෙසැම්බර් 29 දිනැති MF/02/2023 චක්‍රලේඛය යටතේ, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් විමධ්‍යගත අයවැය වැඩසටහන 2024 දී හඳුන්වා දෙන ලද අතර, එහිදී සංවර්ධන ව්‍යාපෘති සඳහා සම්පත් සහ බලය පවරනු ලබන්නේ සහ නිකුත් කරනු ලබන්නේ ජනාධිපති කාර්යාලය විසිනි. තවද

'උරුමය' ඉඩම් හිමි වැඩසටහන, නාගරික නිවාස හිමිකාරීත්ව වැඩසටහන, 'කඳුකර දශකය' සංවර්ධන වැඩසටහන, කෘෂිකර්ම නවීකරණ වැඩසටහන සහ සහල් බෙදාදීමේ වැඩසටහන යන පළාත් පාලන ආයතන ආශ්‍රිත ඇතැම් සංවර්ධන වැඩසටහන් එම කාලය තුළ කඩිමුඩියේ ක්‍රියාත්මක විය. මෙය ජනාධිපතිවරණයට ප්‍රතිලාභ ලබා ගැනීමේ මුලපිරීමක් ලෙස සංශයක් මතු විය. පළාත් පාලන මැතිවරණයට නාමයෝජනා භාර දී ඇති අපේක්ෂකයින්ගේ ප්‍රචාරක කටයුතු සඳහා රාජ්‍ය සම්පත් වෙන් නොකළ යුතු බව පැෆරල් සංවිධානය මෙහිදී අවධාරණය කරන ලදී.

එපමණක් නොව, පළාත් පාලන මැතිවරණයේ අපේක්ෂකයින්, මධ්‍යම පළාතේ සහ බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරුන්ගේ නියෝජිතයන් සහ සම්බන්ධීකාරකවරුන් ලෙස පත්කිරීම සම්බන්ධයෙන් පැෆ්රල් සංවිධානය අවධානය යොමු විය. මෙය පැහැදිලිවම මැතිවරණ නීති උල්ලංඝණය කිරීමක් ලෙසත්, නිදහස් හා සාධාරණ මැතිවරණයකට එරෙහි ක්‍රියාමාර්ගයක් ලෙසත්, නීතියෙන් ඔබ්බට යාමට රාජ්‍ය නිලධාරීන් දිරිමත් කිරීමක් ලෙසත් අවධානයට යොමු විය. පැෆ්රල් සංවිධානය මේ සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරුන්ගේ, අග්‍රාමාත්‍යවරයාගේ සහ මැතිවරණ කොමිසමේ අවධානය යොමු කළේය.

රජයේ සේවකයන්ගේ වැටුප් වැඩිකිරීමේ කැබිනට් තීරණය සම්බන්ධයෙන් පසුගියදා පැෆරල් සංවිධානය මාධ්‍ය නිවේදනයක් නිකුත් කරන ලදී. පැෆ්රල් සංවිධානය මෙම වැටුප් වර්ධකයට විරුද්ධ නොවන නමුත් මෙය නුසුදුසු බව පෙන්වා දුන්නේ තැපැල් ඡන්දය සඳහා දින 02 කට පෙර මෙය තීරණය කළ බැවිණි.

මැතිවරණය ඉලක්ක කර ගනිමින් රාජ්‍ය නිලධාරීන්ගේ පත්වීම්, ස්ථාන මාරුවීම් සහ උසස්වීම් පිළිබඳ පැමිණිලි 61 ක් ඇතුළුව රාජ්‍ය බලය, සම්පත් සහ සේවකයන් අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධ පැමිණිලි 194 ක් පැෆරල් සංවිධනය වෙත ලැබී ඇත. තවද රාජ්‍ය දේපළ අවභාවිතය සම්බන්ධයෙන් පැමිණිලි 74 ක් ලැබී තිබේ. රජයේ වැඩසටහන්වලට සම්බන්ධව සමාජ මාධ්‍ය හරහා අපේක්ෂකයන්ගේ ඡායාරූප ප්‍රදර්ශනය කිරීම, අපේක්ෂකයන්ගේ රැස්වීම් ආවරණය කිරීමට මාධ්‍යවේදීන් ඉල්ලා සිටීම, නිල නොවන දේශපාලන කටයුතු සඳහා රජයේ බලධාරීන්ගේ වාහන අවභාවිත කිරීම, ප්‍රජා පොලිස් කමිටුවක් පිහිටුවීමට මහජනතාවට ආරාධනා කිරීම, දේශපාලනඥයන්ට සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම වැනි සිද්ධීන් මුදල් අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෘත්තිකයන්ට ආරාධනා කිරීම සහ රැස්වීම් පැවැත්වීම, පොලිස් දෙපාර්තමේන්තුවේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ රාජ්‍ය නිලධාරීන් මාරු කිරීම, රාජ්‍ය සේවකයින්ට බලපෑම් කිරීම, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වැනි රාජ්‍ය ආයතනවල සේවකයින් උසස් කිරීමට සහ ස්ථාන මාරු කිරීමට දරන උත්සාහයන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ජාතික ශිල්ප සභාව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, ලංකා විදුලිබල මණ්ඩලය, මධ්‍යම සංස්කෘතික අරමුදල, ගුරුවරුන් සඳහා පත්වීම් ලබා දීම, ලංකා ඛණිජ වැලි සංස්ථාව (ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්), ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සහ අස්වැසුම (සුභසාධන ප්‍රතිලාභ) වැඩසටහන තුළින් දේශපාලන වාසි සඳහා රජයේ ආධාර ලබා දීම ඒ අතර කැපී පෙනේ.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපේක්ෂකයාගේ නාමයෝජනා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නිල linkedin ගිණුමේ රාජ්‍ය සම්පත් අවභාවිත කිරීමේ සිද්ධියක් ලෙස නැවත ප්‍රකාශයට පත් කරන ලෙස පැෆ්රල් සංවිධානය මැතිවරණ කොමිසමට දැනුම් දී ඇත. එසේම, ශිෂ්‍ය රක්ෂණ, විවිධ ඔප්පු සහ වෙනත් ප්‍රදාන පිරිනමමින් පොදු සම්පත් අවභාවිත කිරීමට වත්මන් රජය දරන උත්සාහයන් පිළිබඳව පැෆ්රල් සංවිධානය මැතිවරණ කොමිසමට දැනුම් දී ඇත.

### 4.4. ප්‍රචණ්ඩ ක්‍රියා

ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් පැමිණිලි 59 ක් පැෆ්රල් සංවිධානයට ලැබී ඇත. දේශපාලන පක්ෂ/අපේක්ෂක කාර්යාලවලට පහරදීම් පිළිබඳ පැමිණිලි 22 ක් වාර්තා වී ඇති අතර, බිය ගැන්වීම් සහ තර්ජනය කිරීම් පිළිබඳ පැමිණිලි 15 ක්, පහරදීම් 10 ක් සහ බරපතළ පහරදීම් 06 ක් වාර්තා වී තිබීම විශේෂත්වයකි. මෙම පැමිණිලි අතර, මීරිගම මුතුර්, බොකලගම, දෙවලපොළ, ගම්පහ, පෝද්දල, බදුල්ල විනීතගම, වැලිවේරිය, අවිස්සාවේල්ල තුන්තාන, වැල්ලවාය, මහා පොතාන, රාජාංගනය, හාරිස්පත්තුවේ උගුරැස්සපිටිය, ගම්පොළ, වලස්මුල්ල, හොරොව්පතාන, වැලිපැන්න, අගලවත්ත, සහ වේයන්ගොඩ ආදී ප්‍රදේශවල පෝස්ටර්, කටවුට් විනාශ කිරීම, පක්ෂ/අපේක්ෂක කාර්යාලවලට වෙඩි

තැබීම, පක්ෂ/අපේක්ෂක කාර්යාල විනාශ කිරීම වැනි සිද්ධීන් වාර්තා වේ. එමෙන්ම තැලිගම, අගලවත්ත, වේයන්ගොඩ, දික්හේන සහ මිනුවන්ගොඩ යන ප්‍රදේශවලින් වාර්තා වූ දරුණු පහරදීම් පිළිබඳ සිද්ධීන් වාර්තා විය. වනාතවිල්ලුව, පහත දුම්බර, වැලිකන්ද, මීගමුව, බලකඩුව, හසලක, පෝද්දල සහ හිරියාල වැනි ප්‍රදේශවලින් ප්‍රචණ්ඩ ක්‍රියා වාර්තා වී ඇති අතර එකී සිද්ධීන් පහරදීම් විරෝධතාවල සිට ආධාරකරුවන් අතර ගැටුම්, මෙන්ම පුද්ගලයන්ට පහරදීම් සහ රෝහල් ගත වීම් දක්වා පැතිරී ඇත.

### 4.5. සාධනීය වර්ධනයන්

පසුගිය සතිය තුළ ප්‍රචණ්ඩ ක්‍රියා සහ නීති උල්ලංඝනයන්හි සුළු වැඩිවීමක් දක්නට ලැබුණද, එය සාමාන්‍යයෙන් පූර්ව මැතිවරණ කාලය තුළ වාර්තාවන සිදුවීම් සහ උල්ලංඝනය කිරීම්වලට වඩා අඩු තත්ත්වයකි. මෙම කාලය තුළ බොහෝ ප්‍රචණ්ඩ ක්‍රියා වාර්තා වී නොමැත.

ඡන්දදායකයින්, මැතිවරණ කොමිසම, නීති පද්ධතිය සහ ආරක්ෂක අංශ තීරණාත්මක අයුරින් කටයුතු කරන අතර, මෙය වඩාත් දියුණු දේශපාලන සංස්කෘතියකට මග පෙන්වන සලකුණකි.

එබැවින් පැෆ්රල් සංවිධානය විසින් මැතිවරණ කොමිෂන් සභාව සහ පොලිස් දෙපාර්තමේන්තුව ඔවුන්ගේ හැසිරීම්වලදී පෙන්නුම් කර ඇති වෘත්තීයභාවය සහ අපක්ෂපාතීත්වය අගය කරයි.

## 5. මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන සඳහා රාමුවක් සකස් කිරීමේ මුලපිරීම්

විනිවිදභාවය සහිත් දේශපාලන ක්‍රමයක් සහ පුරවැසියන්ට වගකියන පිරිසිදු දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කිරීමේ ප්‍රයත්නයක් ලෙස පැෆ්රල් සංවිධානය ප්‍රවේශයන් රැසක් ගෙන ඇත. පැෆ්රල් සංවිධානය පසුගිය වසරේ සිට දේශපාලන පක්ෂ සහ ඒවායේ නියෝජිතයන් සමග සන්නිවේදනයේ යෙදී සිටී. කාන්තා හා තරුණ කොටස්, වෘත්තීය සමිති, මැතිවරණ කොමිසම සහ විවිධ සිවිල් සමාජ සංවිධාන වැනි සමාජයේ අනෙකුත් කොටස් සමග ගැඹුරු සංවාදයක් ආරම්භ කිරීම සඳහාත් මෙම ක්‍රියාවලිය විධිමත් කිරීමට උපකාර කිරීම සඳහාත් විද්වතුන්ගෙන් සැදුම්ලත් උපදේශක මණ්ඩලයක් ද ස්ථාපනය කර ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන සකස් කිරීමේදී දේශපාලන පක්ෂ නායකයින්ගේ අවධානය සහ කැපවීම ලබා ගැනීම සඳහා භාවිත කළ යුතු රාමුවක් පැෆරල් සංවිධානය විසින් සකස් කරන ලදී. මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන සැකසීමේ ක්‍රියාවලියේ පදනම, මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන සැකසීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු, අන්තර්ගතය/ව්‍යුහය මැතිවරණ ප්‍රකාශන, මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන මහජනතාවට ඉදිරිපත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, මැතිවරණ ප්‍රකාශන ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම වැනි තේමා පහක් පදනම්කොට ගෙන පැෆ්රල් සංවිධානය මෙම සුවිශේෂී රාමුව සකස් කර ඇත.

දේශපාලන පක්ෂ සමග සාකච්ඡා කිහිපයක් පවත්වමින් පැෆ්රල් සංවිධානය මෙම රාමුව හඳුන්වා දී ඔවුන්ගෙන් ඒ සඳහා කැපවීම ලබා ගැනීමට උත්සාහ දරා ඇත. එසේම, 2024 ජනාධිපතිවරණයට ඉදිරිපත් වන අපේක්ෂකයින් සඳහා මාධ්‍ය අවකාශයක් නිර්මාණය කිරීමටත් ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශන හරහා ඔවුන්ගේ පාලන මූලධර්ම සහ ආර්ථික ප්‍රතිපත්ති හෙළි කිරීමටත් පැෆ්රල් සංවිධානය කටයුතු සම්පාදානය කරන ලදී. ජයග්‍රාහී අපේක්ෂකයන්ගේ, පක්ෂවල සහ සන්ධානවල මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනවල ඇතුළත් සැබෑ ක්‍රියාකාරී සැලසුම් සම්බන්ධයෙන් මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණය හා පසු විපරම් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට පැෆ්රල් ඉදිරියේදී අපේක්ෂා කරයි.

පැෆ්රල් සංවිධානය සහ පුරවැසියන් එක්ව ඉදිරි මැතිවරණවලදී දේශපාලන ප්‍රතිපත්ති ප්‍රකාශන පිළිබඳ විශ්ලේෂණ නිරීක්ෂණය කිරීමට සහ ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් කර ඇති අතර එමඟින් ඔවුන් පුරවැසියන්ට පොරොන්දු වූ දේ ක්‍රියාත්මක කරන ලෙස දේශපාලන පක්ෂවලට බලපෑම් කිරීමට අපේක්ෂා කරයි.

## 6. සියලු දෙනා ඇතුළත් කරගන්නා මැතිවරණයක් තහවුරු කිරීම

මැතිවරණ කොමිෂන් සභාවේ මගපෙන්වීම සහ අධීක්ෂණය ඇතිව ස්ථිර ආබාධ සහිත පුද්ගලයන් සඳහා හැඳුනුම්පත් 5000 ක් ලබාදීමට සම්බන්ධ වෙමින් පැෆ්රල් සංවිධානය සැළකිය යුතු අන්තර්කරණ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. මෙම ප්‍රයත්නයන් ගනු ලැබුවේ මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සක්‍රීය කරමින් ඒ සියලුම පුරවැසියන් ඇතුළත් කර ගැනීම සඳහා ය. පළමු අදියරේ දී පැෆ්රල් සංවිධානය මැතිවරණ කොමිෂන් සභාව සමග එක්ව ආබාධ සහිත පුද්ගලයින් හඳුනා ගැනීමට සහ ඔවුන්ට ප්‍රවේශ වීමට පහසුකම් සැලසීමට උපකාර කිරීම සඳහා කොළඹ, හම්බන්තොට, පුත්තලම, මොණරාගල, මඩකලපුව, යාපනය, අනුරාධපුර, කෑගල්ල, නුවරඑළිය, ගාල්ල, මාතර, පොළොන්නරුව, සහ රත්නපුර යන දිස්ත්‍රික්ක 13 ක හැඳුනුම්පත් පන්දහසක් පමණ ලබා දී ඇත. මෙමගින් ඡන්ද මධ්‍යස්ථානවලට ඇතුළු වීමට විශේෂ අවසරයක් අවශ්‍ය වීම ඉවත් කර ඇත. වව්නියාව, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම, දිගාමඩුල්ල, ත්‍රිකුණාමලය, මහනුවර, මාතලේ, කළුතර, බදුල්ල සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක 11 ක ආබාධ සහිත පුද්ගලයන් සඳහා හැඳුනුම්පත් ලබාදීමේ අරමුණින් පැෆ්රල් මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරයි. මැතිවරණ කොමිෂන් සභාව විසින් ආබාධ සහිත පුදගලයන් සඳහා ප්‍රවේශ විය හැකි මාර්ග, දෘශ්‍යාබාධිත අයට ඡන්දය ප්‍රකාශ කිරීමේ පහසුව සහ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සඳහා අවධානය යොමු කොට ඇත.

## 7. 2024 ජනාධිපතිවරණ විවාදය

පැෆ්රල් සංවිධානයද ප්‍රමුඛව සාමාජිකත්වයක් දරණ මාර්තු 12 ව්‍යාපාරය විසින් විනිවිදභාවය සහ දැනුවත් ඡන්දදායකයින්ගේ තේරීම ප්‍රවර්ධනය කිරීමේ අඛණ්ඩ උත්සාහයේ කොටසක් ලෙස, මෙවර ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත්වන අපේක්ෂකයින් එක් වේදිකාවකට රැගෙන ඒමේ සුවිශේෂී විවාදයක් සංවිධානය කිරීමට කටයුතු කරන ලදී. මෙම ජනාධිපතිවරණයේදී අපේක්ෂකයින්ට ඔවුන්ගේ දැක්ම, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කිරීමට සහ සාකච්ඡා කිරීමට වේදිකාවක් සැපයීම මෙම මුලපිරීමේ අරමුණයි. ජනාධිපතිවරණ විවාදය සැප්තැම්බර් 07, 08, සහ 09 යන දිනවලදී අදියර තුනකින් කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන් ලදී. මාර්තු 12 ව්‍යාපාරය විසින් මෙම විවාදය සඳහා මෙවර ජනාධිපතිවරණයට ඉදිරිපත්වන අපේක්ෂකයින් සියලුම දෙනාට ආරාධනය කළ අතර, ඒ අතරින් අපේක්ෂකයින් 15 දෙනෙකු එය සහභාගීත්වය පිළිගන්නා ලදී. ඩිජිටල් වේදිකාවක් හරහා අපේක්ෂකයින්ගෙන් ප්‍රශ්න ඇසීමට මහජනතාවට ආරාධනා කරන ලදී. මෙම විවාදය සමාජ මාධ්‍ය ඔස්සේ සජීවීව විකාශය විය. දැනුවත් ඡන්දදායකයින් තවත් වර්ධනට කිරීමේ තීරණාත්මක පියවරක් වූ අතර, පුරවැසියන්ට අපේක්ෂකයින්ගේ වගවීම ප්‍රදර්ශනය කරමින් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමක් ලෙස මෙවර ජනාධිපතිවරණ විවාදය සටහන් කළ හැකිය.

## 8. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතාවගේ වගකීම

පැෆ්රල් සංවිධානය මැතිවරණයට පෙර, ඒ අතරතුර සහ පශ්චාත් මැතිවරණ අක්‍රමිකතා සහ ප්‍රචණ්ඩත්වයට එරෙහිව පියවර ගන්නා ලෙස ජනතාව දිරිමත් කරයි. තවද, පැෆ්රල් සංවිධානය නිදහස් හා සාධාරණ මැතිවරණයක් අපේක්ෂා කරන අතර ඒ සඳහා ප්‍රයත්න දරයි. මෙම ප්‍රධාන ඉලක්කය සමගින්, පළාත් පාලන ආයතනවල සිට පළාත් සභා, පාර්ලිමේන්තු සහ ජනාධිපතිවරණය දක්වා සුසංවිධිත මැතිවරණ ක්‍රියාවලීන් සහතික කිරීම, සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ට අදාළ සිද්ධීන් වාර්තා කිරීම සහ ලේඛනගත කිරීම සඳහා ජනතාව විසින් මෙහෙයවනු ලබන අඛණ්ඩ මැතිවරණ නිරීක්ෂණයක් බලමුලු ගැන්වීම වැනි අරමුණු සාක්ෂාත් කර ගැනීමට පැෆ්රල් සංවිධානය අපේක්ෂා කරයි. එසේම මැතිවරණවලදී සහ මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් සහ පූර්ව, අතරතුර සහ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වය සහ අක්‍රමිකතා වැළැක්වීම සඳහා සාමූහික ප්‍රජා මූලික ප්‍රයත්න ප්‍රවර්ධනය කිරීමට මෙන්ම සෑම කෙනෙකුම වගකීමෙන් යුතුව සිය ඡන්ද අයිතිය භාවිතා කිරීම සිදු කරනු ඇතැයි පැෆ්රල් සංවිධානය අපේක්ෂා කරයි.

### ජාතික ලේකම් කාර්යාලයේ (පළාත් මට්ටමින්) පැමිණිලි ලැබීමේ සහ මැදිහත්වීමේ මධ්‍යස්ථානයේ ඇමතුම් විස්තර

| අංකය | පළාත | දුරකථන අංකය | විද්‍යුත් තැපැල් ලිපිනය |
|---|---|---|---|
| 01 | වයඹ | 0701084013 | paffrelnw@gmail.com |
| 02 | දකුණ | 0701083949 | paffrelsp@gmail.com |
| 03 | නැගෙනහිර | 0701083911 | paffrelep@gmail.com |
| 04 | ඌව | 0701084034 | paffrelup@gmail.com |
| 05 | සබරගමුව | 0701083934 | paffrelsg@gmail.com |
| 06 | උතුරු මැද පළාත | 0701083998 | paffrelnc@gmail.com |
| 07 | උතුර | 0701083929 | paffrelnp@gmail.com |
| 08 | බස්නාහිර | 0701084006 | paffrelwp@gmail.com |
| 09 | මධ්‍යම | 0701083974 | paffrelcp@gmail.com |

### ඇමතුම් තොරතුරු

නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහා වන ජනතා ක්‍රියාකාරීත්ය (පැෆ්රල්)
අංක 16, බයර්ඩ් පෙදෙස, පාමංකඩ හරස් පාර, කොළඹ 06
දුරකථනය : +94 11 255 8570
වට්සැප් : https://whatsapp.com/channel/0029Va9bCyOLI8YbWO7aaZ0r
විද්‍යුත් තැපැල් ලිපිනය : paffrel@sltnet.lk
ෆෙස්බුක්: https://www.facebook.com/Paffrel.Organization
යුට්යුබ්: https://www.youtube.com/channel/UCQtjspli-nTqqTC9fq6DcQQ
වෙබ් අඩවිය : https://www.paffrel.com/paffrel/about-paffrel
ටික්ටොක්: https://www.paffrel.com/paffrel/about-paffrel
ඉන්ස්ටර්ග්‍රාම් : https://www.instagram.com/paffrel/
ට්විටර් : https://x.com/PAFFREL
ත්‍රෙඩ්ස් : https://www.threads.net/@paffrel

# 9. ඇමුණුම්

ඇමුණුම 1: එක් එක් කාණ්ඩය යටතේ දිවයින පුරා මැතිවරණ නීතිය උල්ලංඝනය කිරීම, 2024 ජනාධිපතිවරණය

PAFFREL

**Presidential Elections 2024 - Pre-election period**

Violations of law under each category - Islandwide

**From 2024-07-26 10:00:00 To 2024-09-11 16:00:00 - [By Recording Date]**

| Label | Type of Violation | Confirmed | Unconfirmed | Sub Total |
|---|---|---|---|---|
| 1 | Murders | 0 | 0 | 0 |
| 2 | Grievous Assaults | 5 | 1 | 6 |
| 3 | Assaults | 6 | 4 | 10 |
| 4 | Abductions | 0 | 0 | 0 |
| 5 | Attacks with Explosives | 0 | 0 | 0 |
| 6 | Shootings | 0 | 0 | 0 |
| 7 | Threats & Intimidation using Firearms | 0 | 0 | 0 |
| 8 | Damage to Immovable Property | 4 | 1 | 5 |
| 9 | Damage to Movable Property | 1 | 0 | 1 |
| 10 | Intimidation & Threats | 14 | 2 | 16 |
| 11 | Attacks on Political Party/ Candidate Offices | 19 | 4 | 23 |
| | **Acts of Violence** | **49** | **12** | **61** |
| 12 | Misuse of state property | 33 | 42 | 75 |
| 13 | Use of State Vehicles for Election Campaign Purposes | 5 | 4 | 9 |
| 14 | Attempts/ influencing State Officials | 6 | 5 | 11 |
| 15 | Appointments, Transfers & Promotions for State Officials targeting the Election | 13 | 48 | 61 |
| 16 | Use of State Officials & Security Sources for Election Campaign Purposes | 14 | 14 | 28 |
| 16-1 | Provide governtment aid in political gain | 4 | 8 | 12 |
| | **Abuse of State Power, Resources & Employees** | **75** | **121** | **196** |
| 17 | Destruction & sabotage decorations, posters & cutouts of political parties | 11 | 5 | 16 |
| 18 | Disrupting Campaign Activities of Opponents | 0 | 0 | 0 |
| 19 | Carrying out Illegal Election Propaganda | 403 | 228 | 631 |
| 20 | Threatening & Disrupting Work of Election Monitors | 0 | 0 | 0 |
| 21 | State Officers acting in Favor of Political Parties & in Breach of Official Duties | 9 | 11 | 20 |
| 22 | Carrying out Unlawful Meetings & Processions | 1 | 2 | 3 |
| 23 | Maintaining Illegal Party Offices | 16 | 29 | 45 |
| 24 | Giving Incentives with Political Objectives | 40 | 55 | 95 |
| 25 | Using Vehicles without Number Plates | 0 | 0 | 0 |
| 26 | Favouritism & Misuse of State & other Media | 1 | 4 | 5 |
| 27 | Attempts to Influence/ Influencing by Security Sources & State Officials | 0 | 0 | 0 |
| 28 | Spreading of fake news | 3 | 10 | 13 |
| 29 | Carrying out Election Campaign Activities Harassing & Inconveniencing the General Public | 10 | 6 | 16 |
| 30 | Influencing Voters | 2 | 9 | 11 |
| 31 | Irregularities relating to Ballot Papers | 0 | 0 | 0 |
| 32 | Transportation of voters | 0 | 0 | 0 |
| 33 | Giving incentives to voters | 10 | 5 | 15 |
| 34 | Obstructing election officials and activities | 0 | 2 | 2 |
| 35 | Assaulting voters/ using force to turn voters away from polling station | 0 | 0 | 0 |
| 36 | Casting votes illegally/ attempts to impersonate | 0 | 0 | 0 |
| 37 | Other Incidents | 20 | 27 | 47 |
| | **Violation of Election Laws** | **526** | **393** | **919** |
| | **TOTAL** | **650** | **526** | **1176** |

* During the above period, we have recieved **1062** complaints/incidents in relation to **1176** Electoral law / general law violations.

ඇමුණුම 2: මැතිවරණ සිදුවීම් සිතියම, 2024 ජනාධිපතිවරණය

PAFFREL

## Election Incident Map, Presidential Election 2024

Election Law Violations Report: July 27, 2024 – September 11, 2024, 4:00 PM (All Island)

- Total number of complaints - 1124

Complaints related to several Districts - 51

